The Buddhist
පන්සල
Temple

පෝය දින පණිවුඩය

POYA DAY MESSAGE

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස...!!!**

තුම්හෙහි කිච්චං ආතප්පං
අක්ඛාතාරෝ තථාගතා
පටිපන්නා පමොක්කන්ති
ඣායිනො මාර බන්ධනා
( ධම්ම පදය, මග්ගවග්ගය)

## සසර කතර මග පෙන්වූ බුදු පියාණන් වහන්සේ

ධර්මකාමී පින්වතුනි,

අද වෙසක් පුන් පොහෝ දිනයයි. බෞද්ධයින් අද විවිධ පින්කම් කරමින් බුදු පියාණන් වහන්සේ සිහිපත් කරති.

මෙම දහම් පත්‍රිකාවේ මාතෘකාව ධම්මපදයේ මග්ගවග්ගයේ සිව්වෙනි ගථාවයි. බුදුවරු මහත්වූ කරුණාවෙන් කලින් කල ලෝවැසි සත්වයාට හිත වැඩ සැලසීම සඳහා ගම් නියම්ගම් සැරිසරමින් වැඩම කොට පිහිට වෙති. අප ගෞතම බුදු පියාණන් වහන්සේද ජේතවන විහාරයේ සිට පන්සියයක් පමණ භික්ෂුන් වහන්සේලාද පිරිවරාගෙන චාරිකාවේ වැඩම කොට නැවත දෙව්රම් විහාරයටම වැඩම කළහ. සවස් කාලයේ දම්සභාවට වැඩි භික්ෂුන් වහන්සේලා ගම් දනව් සැරිසරා පැමිණි ගමන පිළිබදව, ගමන් මගෙහි ඇති පහසු අපහසු ආදී කරුණු පිළිබඳව කථාකරමින් වැඩ හුන්හ.

එවේලෙහි දම්සභාවට වැඩි බුදුපියාණන්වහන්සේ මග පිළිබඳව මේ කතාව අසා "මහණෙනි ඒ මාර්ගය නියම මාර්ගය නොව සිව්සස් දහම් අවබෝධ කොට මාර්ගඵලයන්ට සැපත්ව නිවනට යා යතු අරි අටඟි මග නියම මගයයි" වදාළහ.

එසේ වදාරා ගාථා හතරකින් ධර්මදේශණා කොට ඒ භික්ෂුන් වහන්සේලා පන්සියයම රහත්ඵලයෙහි පිහිටවු සේක.

එහි සතරවෙනි ගාථාව මෙහි මාතෘකා වශයෙන් තබා ඇත "තුම්හේහිකිච්චං ආතප්පං" ඔබ විසින් කෙලෙස් තවන වීර්යය ඇතිකර ගත යුතුය. "අක්ඛාතාරෝ තථාගතා" තථාගතවරයෝ මග කියා දෙන්නෝ වෙති."පටිපන්නා පමොක්ඛන්ති"පිළිපන්නා වු ධ්‍යාන කරන්නෝ "ඣායිතෝ මාර බන්ධනා " මර බැම්මෙන් මිදෙන්නාහ".

ඉහත විස්තර දැක්වූයේ ගාථා හතරේ හතර වෙනි ගාථාවයි. අනෙක් ගාථා තුනද බුදු පියාණන් වහන්සේ සිය විමුක්තිය ලබා ගත් ආකාරයත් එයින් තමන් වහන්සේ යා යුතු මග නිවැරදිව ගිය බවද මරු පරදවා නිවන දැක ගත් බවද වදාළහ.

හතරවෙන් ගාථාවේ අදහසට අනුව වෙසක් පෝය දිනය උන්වහන්සේගේ මෙම අවවාදයට සමගාමීව කටයුතු කරමින් අප අපගේ විමුක්තිය උදෙසා ක්‍රියාකාරී වෙනවාදැයි විමසා බලමු.

ලොව උපන් හෑම සත්වයෙකුටම පියෙක් ඉන්නවා. බොහෝ විට එම සත්වයින්ට ඒ පියා නිතැතින්ම ආරක්ෂකයෙකි, නියමුවෙකි, මග පෙන්වන්නෙක් වශයෙන් ජීවිත ගමනෙහි බිය නැති කරයි. ඒ නිසා පියාණන් යන වචනයද ශාන්තිය ගෙන දෙන සැනසීම ඇති කරන වචනයකි.

අපවත් වී වදාල පැලෑනේ ශ්‍රී වජිරඥාණ මහ නාහිමියන ලියූ "බෞද්ධ ළමයා" නම් කවි සඟරාවේ මෙසේ පියා පිළිබඳව දැක්වේ.

සා පවසින් මිරිකී දිවලෙහි යෙදෙති
බෝ සුළුවෙන් යැපෙමින් දරුවන් වඩති
මේ අයුරින් දිව රෑ පියවරු හිතැති
දූ දරුවන් පිණිසම හැම දුක් විඳිති

මිනිස් පියෙක් මිනිස් දරුවන්ගේ ආරක්ෂාවට සාපිපාසා විඳිමින් බොහොම සුළුවෙන් ආහාරයක් ගනිමින් දවල් රෑ දෙකේම දූ දරුවන් පිණිසම හැම දුකක්ම විඳින බව මේ කවියෙන් කියැවේ. අපි ඕනෑම කෙනෙකුට මේ කවිය ගැන සිතන විට තමන්ගේ පියා සිහිවෙනවා, ඇලමක් ගෞරවයක් ඇති වෙනවා.

හැම තාත්තා කෙනෙක්ම දරුවන් දුකට වැටෙනවට කැමති නැහැ. ඒ නිසා හැම විටම පියාණන්

ආරකෂක දේවතාව ලෙසටත් කෙටියෙන් කියනවනම් පියා “සිතට ශක්තියක් යැයි ” නොහැඟුනේ කාටද?

පියා සතු මේ ගුණය තුල ඇත්තේ මෛත්‍රිය කරුණාව මුදිතාව හා උපේක්ෂාවයි. ඒ බව බුදු පියාණන් වහන්සේ “ බ්‍රාහ්මති මාතා පිතරෝ ” මවු පියන් මහා බ්‍රාහ්මයෝය. සිවු බඹ විහරණයෙන් තම දරුවන් දෙස ඔවුන් හැමවිටම බලති. ජීවන මාර්ගයේ නිසි තැනට යන තුරු මියෙන තුරා පියාගේ කාර්‍යභාරය ඉටු කරයි.

පියාණන් හෙවත් තාත්තා පිළිබඳව මේ සරල විග්‍රහය කලේ බුදු වරුන්ටද අප පියාණන් වහන්සේ යන ගෞරව නාමය භාවිතා කිරීමද සිදු කරන නිසාය. කෝටියක් පියවරුන්ගේ බ්‍රහ්ම විහරණ එක තැනකට එක් කලා මෙන් හෙයින් බුදු පියාණන් යනුවෙන් ආමන්ත්‍රණය කරන හෙයින්ය. බුදු පියාණන් වහන්සේ පිළිබඳව හරි අවබෝධයක් ඇති කර ගැනීමට රහතන් වහන්සේ නමකට වුවද පහසු නොවේ. මහා නුවණ ඇති ඊට අග තැන්පත් සැරියුත් මහ රහතන් වහන්සේටද හරියට පෙනෙන බුදු ගුණ ඇත්තේ ස්වල්ප වශයෙනි. මේ අනුව සාමන්‍ය ජනයාට දැනගත හැකි වන්නේ බුදු ගුණ ඉතා ස්වල්පයකි. එසේ බුදු ගුණ ස්වල්ප වශයෙන් හෝ දැනගත් කෙනෙකුට විනා නොදන්නා කෙනෙකුට මෙසේ ගෞරව නාමයන් ආරෝපණය කරන්නටද නොසිතේ, නොදනී.

සකළ ලෝක සත්වයින්ගේම දුක හඳුනාගෙන ඒ දුකට නිසි පිළියම් සොයන්නට සැබෑ දුකක් විඳි කෙනෙක් ඒ සියළු ලෝක සත්වයන්ටම පියාණන් වූ කෙනෙකු මිනිස් ලොව වෙන පහළ වූයේ නැත.

අංගුත්තර නිකායේ ඒක පුග්ගල වග්ගයේ “ ඒක පුග්ගලස්ස පාතුභාවෝ දුල්ලභෝ ලෝකස්මින්ති” මේ එක් පුදගලයාගේ ඉපදීම ලොව දුර්ලභය යනුවෙන් සඳහන් ඒ බවයි. සංසාර දුක නම්වූ ලෝක පීඩාවෙන් සත්වයා බේරා ගැනීමට ස්කන්ධ වශයෙන් අසුසාර දහසක් ධර්මය දේශනා කලේ පීතෘ සෙනෙහස උතුරා ගිය බැවිනි. ඒ නිසා බුදු රජාණන් වහන්සේ හඳුනාගත් පුද්ගලයාට තනිකම භය නොදැනේ, ඒ බුද්ධානුස්සතියයි. සසර ඇති බියකරු කම පිළිබඳව ඇති බිය පහව යයි.

පියාගේ අවවාද නොරිස්සීම ගණන් නොගැනිම පියාගේ විෂය ඉක්මවීමයි. බුදු රජාණන් වහන්සේගේ අවවාදය ඉක්මවීමට උන්වහන්සේගේ සරණ ගිය කාටවත් ඉඩක් නැත. එසේ කරයි නම් ඔහු හෝ ඇය බුදු පියාණන්ගේ සරණ නොගිය අයෙකි.

ජාතක කථා පොතෙහි වන භේරිවාද ජාතකයෙහි උගන්වන්නේ පියා විසින් එපා කීව් බෙර පද ගැසීමෙන් ගැසිය යුතු නොගැසිය යුතු සීමා ඉක්ම වීමෙන් පිය පුතු දෙදෙනාටම දුකසේ උපයාගත් වස්තුව අහිමි වී ධනයෙන් පිරිහීමයි. පුදු පියාණන් වහන්සේ ලෝ වැසි දාරක ප්‍රජාවට ඉගැන්වූ පදය අප්‍රමාද නම්වූ පදයයි. එහෙත් වෙසක් පෝ දිනය වැනි උතුම් දිනයකදීද බොහෝ දෙනෙක් ගහන්නේද නොගැසිය යුතුයැයි අවවාද කල ප්‍රමාද නම් වූ මාරයාගේ පදයයි. එම පදයේ මාර බන්ධන තුනක් ඉගැන්වෙයි. එනම්

1) නැවත නැවත සසර උපතට හේතු වන කර්ම සිදු වීමයි.
2) සිත හා සම්බන්ධව ඇති වන කෙළෙස් ( තෘෂ්ණාව) ඇති වීමයි.
3) කර්ම විපාක වශයෙන් ඇති වන්නාවූ කර්ම බලයද වශයෙනි.

එම මාර බන්ධනයන්ගෙන් මිදිම සඳහා ආර්‍ය සත්‍යයවූ දහම් අවබෝධ කරගත යුතුය. ඒ සඳහා සම්මා සම්බුදුවරු නියම ආර්‍ය මාර්ගය පෙන්වා දෙනුයේ මහා කරුණාවෙනි.

කය අපිරිසිදු වූවෙක් තම කය රෝගී වී දුකට පත්වන නිසා වහ වහා සෝදා පිරිසිදු කර ගනීද, අපිරිසිදු වූ සිතද තමන් විසින්ම පිරිසිදු කල යුතුය. වෙනත් කෙනෙකුට සිදු කල නොහැකිය. සංසාර දුක දුරු කර ගැනීම නැති කර ගැනීම සඳහා ආර්‍ය අශ්ඨාංගිකව මග දේශනා කර ඇත. එහි ගමන් කරන්නාගේ ප්‍රතිපදාව මධ්‍යම ප්‍රතිපදාවයි. සීමා නොඉක්මවූ මැදුම් පිළිවෙතයි. එයින් ශ්‍රේෂ්ඨ මනුශ්‍යයෙක් බවට පත්වේ. “ තුම්හේහි කිච්චං ආත්ප්පං” තමා විසින් වීර්‍යය කොට දෙවැදැරුම් වූ භාවනා වැඩිය යුතුය. අත අල්වාගෙන නිවනට පමුණුවන කෙනෙකු නැත.

වෙසක් දිනය උපෝසත දිනය සේ ප්‍රධාන වශයෙන් සලකා “ වෙසක් සැණකෙළිය” ලෙස නොසලකා දන්සැල් ආදියම පැවැත්වීමටම මුල් තැන නොදී තථාගත අවවාදය සිහිකොට ඉහත සඳහන් දානමාන සැනකෙළි රෑකඩ නැටවීම දහඅට පාලි වැනි ආමිසයට සහ නිරර්ථකවූ බුදු සසුනක් නොමැති කාලයකදීද සිදු කල හැකි නිසාද ධර්මය අවබෝධ කොට දුකින් නිදහස් වීමට බුදු සසුනක් පවතිද්දී විනා නැති කලකදී නොහැකිය. ඒ උත්තම අවවාදය අතහැර අමතක කොට වල්මත්වූ ලෙසට වෙසක් පෝය දිනය ගත නොකොට අවබෝධයෙන් බුදු පියාණන් පුදමු.

මේ කරුණු වලින් පෙනී යන්නේ බුදු පියාණන්ට ඕනෑ කලේ ලෝක සත්වයාට මාර්ග උපදේශකයෙකු, ආදරණීය පියෙකු මෙන් නියම මාර්ගය පෙන්වීමයි.

යම් බුද්ධිමතෙකුගේ ගුරු උපදේශ නැතිව ජාති ( ඉපදීම) ජරා ( දිරීම ) මරණ ( අභාවය-විනාශය) කියන කරුණු තුන අවබෝධ කරගෙන එයින් නිදහස්ව අපටද ඒ මග කියා දුන් උත්තමයෙකි බුදු රජාණන් වහන්සේ.

උන් වහන්සේ මීට අවුරුදු 2552ට පෙර පිරිණිවන් පෑහ. එනමුදු අද නැති උන්වහන්සේගෙන් ගත හැකි එකම පිහිට උන් වහන්සේ මග පෙන්වූ මග ගමන් කිරීමයි. උන්වහන්සේ දුන් අවවාද පිළිපැදීමයි.

එනම්

* උපන් කෙලෙස් නැසීම
* නූපන් කෙලෙස් නොඉපදවීම
* උපන් කුසල වඩා දියුණු කිරීම
* නූපන් කුසල් ඉපදවීමයි

මේ අවවාදය නොපිළිපදින යම් ගිහියෙක් හෝ පැවිද්දෙක් වේ නම් ඒ බුද්ධ ශාසනය හඳුනා ගත්තෙක්

නොවෙයි. බුද්ධ ශාසනයක් පහළ වන්නේ ජාති ජරා මරණාදී දුක්ඛයන්ගෙන් මිදීමට විනා වසරකට වරක් බයිලා නටා වෙසක් සැණකෙළි ඔළු බක්කන් නටා විනෝද වීමටත් ලෝකේ ආගම් අතර තවත් එක් ආගමක් බවට පත්කර ගෙන අදහ අදහා පුද පුද ඉන්නටත් නොවේ.

බුදු පියාණන් වහන්සේ අපට පියෙකි. උන් වහන්සේ මහත් වීර්‍යයයෙන් දුකසේ සොයාගත් සත්‍ය ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය ඔස්සේ ලෝකය අවබෝධ කර ගැනීම මිස වෙන කුමක් කලත් එලක් නැත. කොසොල් මහ රජු, බන්ධුල මල්ලිකාව බුදු පියාණන්ගේ අතිජාත අග්‍ර ගණයේ දායක දුවෙක් සහ පුතෙකි. ඒ දෙදෙනාගෙන් කිසිවෙක් නිවන් දුටු බව ධර්මය නොකියයි. " අසදෘෂ මහා දානය" දුන්නේද ඔවුන්මය. එහෙත් නියම අවවාදයේ නොපිහිටියේය.

වෙසක් පොහෝ දින අපිදු උන්වහන්සේ ගිය උතුම් මග ගමන් කරමු.

" බුද්ධං සරණං ගච්චාමි "

උන් වහන්සේ දෙසු දහම, කියාදුන් මග තේරුම් ගනිමු !!

" ධම්මං සරණං ගච්චාමි "

ඒ උතුම් අවවාදයෙහි පිහිටා උත්තර මනුෂ්‍ය ධර්ම උදාකර ගත් ඒ තුලින් සදා සැනසිල්ල උදා කරගත් යම් පුරුෂ යුගල වශයෙන් පුද්ගලයන් අට දෙනෙක් වේද, එබඳු උත්තමයින්ගේ ආදර්ශය පතමු.

" සංඝං සරණං ගච්චාමි "

හැම දෙනාටම සුභ වෙසක් මංගල්‍යයක් වේවා !!





වැලිගම ශ්‍රී සුගත ශාන්ති සේවා සංසදයේ නිර්මාතෘ
ගරු සභාපති ටී. ඩබ්ලිව්. ඒ. කල්‍යාණ වසන්ත



LAKRUHUNA
www.lakruhuna.com

Designed By MIRACLE CREATIVE GALLERY
0544 901 366